# සමූපකාර සේවක කොමිෂන් සභාව (දකුණු පළාත)
## கூட்டுறவு ஊழியர் ஆணைக்குழு (தென் மாகாணம்)
## Co-operative Employees Commission (Southern Province)

සැලසුම් ලේකම් කාර්යාලයීය ගොඩනැගිල්ල (1 වන මහල), එස්. එච්. දහනායක මාවත, ගාල්ල.
திட்டமிடல் செயலாளர் அலுவலக் கட்டிடம் (1ம் மாடி), எஸ்.எச், தஹநாயக மாவத்தை, காலி.
**Planning Secretariat Building (1 st Floor), S. H. Dahanayaka Mawatha, Galle.**


| මගේ අංකය / எனது இல / My No. | SP/CEC/1/0/02 | ඔබේ අංකය / உனது இல / Your No. | | දිනය / திகதி / Date | 2020.12.04 |
|---|---|---|---|---|---|

චක්‍රලේඛ අංක : 01/2020

දකුණු පළාතේ සියලුම සමූපකාර සමිතිවල සභාපතිවරුන් වෙත,

**<u>අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් දිනකදී සාමාන්‍යාධිකාරීවරයෙකු වෙත ගෙවන දීමනාව සංශෝධනය කිරීම</u>**

දකුණු පළාතේ සමූපකාර සමිතිවල සේවය කරන සාමාන්‍යාධිකාරීවරුන් සඳහා ගෙවන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගීවීමේ දීමනාව වැඩි කරන ලෙස කරන ලද ඉල්ලීම් පිළිබඳ සලකා බැලූ කොමිෂන් සභාව, ඉහත සඳහන් දීමනාව සම්බන්ධයෙන් මීට පෙර නිකුත් කරන ලද සියලුම චක්‍රලේඛ මෙයින් අවලංගු කර, 2020.12.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි එම දීමනාව පහත අයුරින් සංශෝධනය කිරීමට තීරණය කරන ලදී.

02. ඒ අනුව, මෙතෙක් එක් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකට සහභාගී වීම වෙනුවෙන් ගෙවන ලද රු.500/-ක් වූ දීමනාව වෙනුවට සමිති ශ්‍රේණිගත කිරීම් අනුව A,B ශ්‍රේණියේ සමිති සඳහා රු.1,000/-ක් ද, C ශ්‍රේණියේ සමිති සඳහා රු.750/- ක්ද, එයට පහළ ශ්‍රේණිවල සමිති සඳහා රු.600/-ක් ද ලෙස දකුණු පළාතේ සියලු සමූපකාර සමිතිවල අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට සහභාගී වීම වෙනුවෙන් සාමාන්‍යාධිකාරීවරුන්ට ගෙවනු ලබන දීමනාව වැඩි කිරීමට කොමිෂන් සභාව අනුමැතිය ලබා දී ඇත.

03. එසේම මෙම දීමනාව ලැබීමට හිමිකම් ලබන්නේ පිරිස්බල තක්සේරුව අනුව කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව සේවයේ යෙදෙන සාමාන්‍යාධිකාරීවරුන් සඳහා පමණි.

04. මෙම චක්‍ර ලේඛය දකුණු පළාත් සමූපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්ගේ ද නිර්දේශය ඇතිව නිකුත් කරන ලදී.

කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

ජයන්ත ජී. ලියනගේ
ලේකම් (වැ.බ.)
සමූපකාර සේවක කොමිෂන් සභාව
දකුණු පළාත

ජයන්ත ජී.ලියනගේ.
ලේකම්,
සමූපකාර සේවක කොමිෂන් සභාව,
දකුණු පළාත.

පිටපත :- 01. ලේකම් - කෘෂිකර්ම ගොවිජන සංවර්ධන....සමූපකාර අමාත්‍යාංශය (ද.ප) - දැ.ස.
02. සමූපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් (ද.ප) - දැ.ස.
03. දිවයිනේ සියලුම පළාත් සමූපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරු - දැ.ස.
04. දකුණු පළාත් සමූපකාර සේවක කොමිෂන් සභා චක්‍රලේඛ ගොනුව - දැ.ස.


ලේකම් / செயலாளர் / Secretary 091-2232794 | පරිපාලන නිලධාරී / நிர்வாக அதிகாரி / Administrative Officer 091-2234279 | කාර්යාලය/ෆැක්ස් / அலுவலகம்/பெக்ஸ் / Office/ Fax 091-2234383 | වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site www.cec.sp.gov.lk | විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail empcommicoopsp@sltnet.lk